# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2326/52 – 2023 අප්‍රේල් මස 06 වැනි බ්‍රහස්පතින්දා – 2023.04.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරළේ සුළු කොට්ඨාසයේ, පැනැටියන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MA/WEP/2021/03 හා 2021.03.24 වන දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබල්ලට මායිම්:

01. කැබලි අක්ෂර '**A**' – ගොඩවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0132

උතුරට සහ නැගෙනහිරට: වික්‍රමතුංග ආච්චි පතිරණගේ මැගිලින් හිමිකම් කියන ගොඩවත්ත; දකුණට: ප්‍රාදේශීය සභා මාර්ගය; බටහිරට: වික්‍රමතුංග ආච්චි පතිරණගේ මැගිලින් හිමිකම් කියන ගොඩවත්ත.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/24/2020/HA/101.
2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 04-0066

1A – G 039309 – 18 (2023/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*